•

# මාතලේ දොරකුඹුරේ වෙද පරපුර හා ගෙඩි, වණ, පිළිකා වෙදකම

පාරම්පරික වෛද්‍ය සී.එම්.බී.එම්. විජේරත්න

මාතලේ ගම්පහ සියපත්තුවේ අලුවිහාරයට යාබද ව දොරකුඹුරේ වෙදකම රාජගුරු බණ්ඩාර වෙද පරපුරෙන් පාරම්පරිකව පැවත එන්නකි. ලංකාවේ විවිධ පෙදෙස්වල විසිරී පවත්නා සිංහල වෙදකමෙහි වූ විවිධ අංගයන් අතර ගෙඩි, වණ, පිළිකා වෙදකම හිමිකර ගනුයේ අද්විතීය ස්ථානයකි. ඒ හා සබැඳුණු වෙද පරම්පරා අතර, මාතලේ දොරකුඹුර වෛද්‍ය පරපුර සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන ඇත. වර්තමානයේ මෙම පාරම්පරික වෛද්‍ය කර්මයන් සඳහා මහජනතාවගේ ඇති නැඹුරුව ඉතා ඛේදජනකය. නමුත් මෙහි ප්‍රතිඵල විශ්මය ජනකය.

විශේෂයෙන් ගෙඩියක් සෑදී එනවිට එය සෑදුණු ආකාරය හඳුනා ගැනීම ඉතා වැදගත්ය. එමෙන් ම තැල්මක්ද, විසප්පුවක්ද, ලේවිෂවීමක්ද, සෙම් හෝ වාත මූලික අවස්ථාවක් ද යන්න හඳුනාගත යුතුය. මෙහි දී වාත ගෙඩියක් නම් ඒ සඳහා කෂාය, තැවුම්, පත්තු දැමීම ප්‍රථමයෙන් සිදු කළ යුතුය. පළමු ව එය අඩු කිරීමට හැකි ද යන්න සොයාබැලිය යුතුය. එවැනි අවස්ථාවක් පවතී නම් රත්මල්කොළ, පොතු මිට බැගින් ගෙන කොටා මිරිකා ඉස්ම ගෙන හාල්පිටි දමා කකාරා පැහැවා දැමීමෙන් සුවකර ගත හැකිය.

එමෙන් ම එහි තවදුරටත් තද ගති පවතී නම් බිම්දුම්මල, කොළ ලාකඩ, තිත්ත අබිං, පෙරුංකායම්, අත්තන ඇට, දෙහි දළු යන මේවා කලං 1 බැගින් ගෙන (දෙහි කොළ මිටක් පමණ) එකට කුඩු කර ටික ටික අවශ්‍ය අවස්ථාවල කිකිළි බිත්තර සුදු සාරුවෙන් අඹරා උදේ සවස ගෑමෙන් ගෙඩි අඩු කර ගත හැක.

**තැවිල්ලක්** - ඉඟුරු, ගම්මිරිස්, අබ, කපු ඇට, කොට්ට පොල් එකට කොටා පොට්ටනි බැඳ වණ්ඩුවේ තම්බා අත් උණු පැමෙන් තබා බෙහෙත් ගැල්විය යුතුය.

**කෂාය** - තුන් දොස් සමන කෂාය ලබාදිය යුතුය.

**1.** වියළි ඉඟුරු, ගම්මිරිස්, ඇහැළ පොතු, අරළු යන මේවා කලං 3 බැගින් ගෙන කෂාය කර සහිඳ ලුණු ,පෙරුම්කායම්, සමඟ වඩි 3ක් වරු 9ක් පානය කිරීමෙන් සුවය ලැබේ.

**2.** අරළු, බුළු, නෙල්ලි, රසකිඳ, රත්හඳුන්, දුම්මැල්ල, කොහොඹ පොතු, පාවට්ටා මුල් යන මේවා කලං 1 මදට 8 බැගින් කෂාය කර පිටි, සීනි, මී පැණි සමඟ පානය කිරීම.

**3.** ගුගුල්, අරළු, බුළු, නෙල්ලි කෂාය කර සීනි, මී පැණි සමඟ පානය කිරීම.

**කටු පිළිකා සඳහා ප්‍රතිකාර**

විශේෂයෙන් මෙම වෛද්‍ය කර්මය තුළ කටු පිළිකා ගල් තැලුම් සඳහා ප්‍රතිකාර සඳහන් වේ.

1. කරපිංචා කොළ, පොතු, අමුකහ, ලුණු ස්වල්පයක් එකට කොටා මලවා අප පරම්පරාගත ක්‍රමයෙහි වූ තෙල් වලින් මිශ්‍ර කර දින කිහිපයක් උදේ, සවස එම ස්ථානයේ බැඳිය යුතුය.

2. කටුපිල කොළ, පොතු, අමු කහ, ලුණු

3. බෝ පොතු, මුරුංගා පොතු, සියඹලා පොතු, අමු කහ, ලුණු

4. ලුනුවරණ කොළ, කොහොඹ කොළ, දිවුල් කොළ, දෙහි කොළ, දොඩම්, නාරං ලෙලි, අරළු, ඉඟුරු, ලුණු මේවා එකට කොටා මලවා බැඳීම කළ යුතුය.

මෙවැනි ඖෂධ ප්‍රතිකාර සති කිහිපයක් කළ පසු අප පරම්පරාගත ව ඇති විශේෂ ඖෂධයකින් ටිකදිනක් රත් කිරීමෙන් කටු පිළිකා, ගල් තැලුම් සුව කළ හැක. අප වෛද්‍ය ක්‍රමය තුළ මෙවැනි සුවිශේෂී ප්‍රතිකාර ක්‍රම බොහෝය.